## හිමිකම් රක්ෂණ අරමුදල - 2012

------------------------------------

**1.** <u>මූල්‍ය ප්‍රකාශන</u>

**1.1** <u>මතය</u>

මූල්‍ය ප්‍රකාශනවලින් 2012 දෙසැම්බර් 31 දිනට හිමිකම් රක්ෂණ අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.** <u>මූල්‍ය සමාලෝචනය</u>

**2.1** <u>මූල්‍ය ප්‍රතිඵල</u>

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා වූ මෙහෙයුම් කටයුතුවල ප්‍රතිඵලය රු.2,470,006 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපී ඉකුත් වර්ෂයෙ අතිරික්තය රු.1,234,312 ක් වූයෙන් මූල්‍ය පතිඵලයේ රු.1,235,694 ක වර්ධනයක් පෙන්නුම් කෙරිණි.

ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ හිමිකම් ලියාපදිංචි කිරීමේ ආදායම රු.1,039,596 කින් හා ආයෝජන පොළී ආදායම 216,226 කින් ඉහල යාම මූල්‍ය ප්‍රතිඵලයේ වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**3.** <u>ගිණුම්කටයුතුභාවය හා යහපාලනය</u>

**3.1** <u>අයවැය පාලනය</u>

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අයවැයගත අගයන් හා තත්‍ය අගයන් අතර සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූ බැවින් අයවැය ලේඛනය ඵලදායි පාලන කාරකයක් ලෙස භාවිත කර නොතිබුණි.

(ආ) 2006 දෙසැම්බර් 22 දිනැති අංක ජීඑෆ්/423 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 4.1 ඡේදයේ විධිවිධාන ප්‍රකාරව සමාලෝචිත වර්ෂයේ අයවැය ලේඛනය සඳහා විෂයභාර අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.

## 4. <u>පද්ධති හා පාලනයන්</u>

1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරිමේ පනත අනුව ඉඩම් සම්බන්ධයෙන් ඔප්පු මගින් සිදුවන ගනුදෙනු ලේඛනගත කිරිම වෙනුවට ඉඩම්වල අයිතිය ලියාපදිංචි කිරිම සිදුකර තිබුණි. මෙම අයිතිය ලියාපදිංචි කිරීමේදි සිදුවිය හැකි වංචනික ක්‍රියා හේතුවෙන් හෝ වෙනයම් ආකාරයක අතපසුවිමක් හේතුවෙන් අයිතිය සම්බන්ධයෙන් වන වැරදි තිරණයන් නිසා පාර්ශවකරුවන්ට සිදුවන හානිය සම්බන්ධයෙන් රජය වගකිමකට බැදෙන අතර, ඒ අනුව සිදුවන අලාභය වෙනුවට වන්දි ප්‍රදානය කිරිමට මෙම පනතින් විධිවිධාන සලසා ඇත. මෙම අරමුණ ඇතිව 2010 මාර්තු 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි හිමිකම් රක්ෂණ අරමුදල පිහිටුවා තිබුණි. මෙම හානිපූර්ණය කිරිමේදි පනතේ විධිවිධාන අනුව අධිකරණ ක්‍රියාමාර්ගයකට යොමු විය යුතු අතර අධිකරණය මගින් දෙනු ලබන තීන්දුවක් මගින් අදාල පාර්ශවවලට ගෙවිය යුතු වන්දි මුදල තිරණය කරනු ලැබේ.